දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 01/ 2019 (1)
මගේ අංකය : බ.කො.මු./ ම.ගි./ 2019/ මු.රෙ. 135
ගිණුම් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2019.02.

අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
සියළුම කොමසාරිස්වරුන්/ අධ්‍යක්ෂවරුන්
සියළුම බන්ධනාගාර අධිකාරිවරුන්
සියළුම සහකාර බන්ධනාගාර අධිකාරිවරුන්
සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත.

<u>ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබද බලතල පැවරීම - 2019</u>

2019 ගිණුම් උපදෙස් හා මූල්‍ය පාලනය පිළිබද බලතල පැවරීම සම්බන්ධව නිකුත් කරන ලද මගේ අංකය : බ.කො.මු./ ම.ගි./ 2019/ මු.රෙ. 135 හා 2019.01.11 දිනැති චක්‍රලේඛය හා බැදේ.

2. එම චක්‍රලේඛයේ අංක 8 ඡේදය යටතේ ප්‍රසම්පාදන කමිටු සම්බන්ධව ලබා දී ඇති උපදෙස් වලට වැඩිමනත් වශයෙන් පහත සඳහන් අතිරේක උපදෙස් ඇතුළත් කර ගත යුතුය.

1. **ප්‍රසම්පාදන කමිටු පත්කිරීම**

| කමිටුවේ නම | සාමාජිකයින් | තනතුර | පත්කිරීම | වගකීම |
|---|---|---|---|---|
| 1. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව | 1.බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2.බන්ධනාගාර කොමසාරිස් (මුදල්)<br>3.අමාත්‍යාංශ නිලධාරියකු | සභාපති<br>සාමාජික<br>සාමාජික | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නම් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන අතර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අමාත්‍යාංශ සාමාජිකයින් නම් කර කමිටුව අනුමත කිරීම | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| 2.බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සුළු පරිමාණ ප්‍රසම්පාදන කමිටුව | 1.බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>2.නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)<br>3.බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන/ සැපයුම්) | සභාපති<br>සාමාජික<br>සාමාජික | බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත පත්කරනු ලබයි. | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| 3.බන්ධනාගාර ආයතනවල ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව (රු.50,000.00ට අඩු) | 1.බන්ධනාගාර අධිකාරි<br>2. 1පෙළ ජේලර්/ගිණුම් ජේලර්<br>3.ජේලර්/විෂය දැනුමැති නිලධාරි | සභාපති<br>සාමාජික<br>සාමාජික | බන්ධනාගාර අධිකාරීගේ ඉල්ලීම මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය යටතේ පත්කරනු ලබයි. | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |

## 2. තාක්ෂණ කමිටු පත්කිරීම

| කමිටුවේ නම | සාමාජිකයින් | තනතුර | පත්කිරීම | වගකීම |
|---|---|---|---|---|
| 1.දෙපාර්තමේන්තුවේ මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව සඳහා තාක්ෂණ මණ්ඩලය | ප්‍රසම්පාදන කාර්යයේ අවශ්‍යතාවය අනුව විෂයභාර ක්‍රියාකාරී පාලන නිලධාරීන්(සැපයුම්/ඉංජිනේරු/ පුනරුත්ථාපන/කර්මාන්./පාලන)ගේ නිර්දේශය මත සාමාජිකයින් 3 දෙනෙකු හෝ 5 දෙනෙකු | තෝරා ගන්නා නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සභාපති, සාමාජිකයින් නම් කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු ලබයි. | විෂයභාර ක්‍රියාකාරී නිලධාරීන්ගේ නිර්දේශය මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත පත්කරනු ලබයි. | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| 2.දෙපාර්තමේන්තුවේ සුළු පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩල සඳහා තාක්ෂණ කමිටුව | ප්‍රසම්පදන කාර්යයේ අවශ්‍යතාවය අනුව විෂයභාර ක්‍රියාකාරී පාලන නිලධාරීන් (සැපයුම්/ ඉංජිනේරු/පුනරුත්ථාපන/කර්මාන්ත/පාලන)ගේ නිර්දේශය මත සාමාජිකයින් දෙදෙනෙකු සහ ප්‍රසම්පාදනයට අදාළ වන බන්ධනාගාර අධිකාරිවරයා<br>බන්ධනාගාර අධිකාරී<br>ජේලර්<br>විෂය දැනුම ඇති නිලධාරියෙකු (වෘත්තිය උපදේශ/සංවර්ධන නිලධාරී/ වැඩ මූලික/වැඩ පරිපාලන/ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් හෝ වෙනත් දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සුදුසු නිලධාරියකු) | සභාපති<br>සාමාජික<br>සාමාජික | විෂයභාර ක්‍රියාකාරී නිලධාරීන්ගේ නිර්දේශය මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත පත්කරනු ලබයි. | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |
| 3.බන්ධනාගාර ආයතනවල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සඳහා තාක්ෂණ කමිටුව | සහකාර බන්ධනාගාර අධිකාරී/ ප්‍රධාන ජේලර්<br>ජේලර්වරයෙක්<br>විෂය දැනුම ඇති නිලධාරී (වෘත්තිය උපදේශ/සංවර්ධන නිලධාරී/ වැඩ මූලික/වැඩ පරිපාලන/ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් හෝ වෙනත් දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සුදුසු නිලධාරියකු) | සභාපති<br>සාමාජික<br>සාමාජික | බන්ධනාගාර අධිකාරීගේ නිර්දේශ මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත පත් කරනු ලබයි. | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) |

3.බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික කමිටු පත්කිරීම සම්බන්ධව ඉහත උපදෙස් 2019 වර්ෂයේ සිට බලපැවැත්වන බව දන්වන අතර එම චක්‍රලේඛයේ සඳහන් අනිකුත් උපදෙස් කිසිදු වෙනස් කිරීමක් නොමැතිව ඒ ආකාරයට බලපවත්වන බව ද වැඩි දුරටත් කරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.එන්.සී. ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත් :- 01. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. ලේකම් , අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.